**තංගල්ල ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 අහිතකර මතය**

තංගල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම වන 1.6 ඡේදයේ ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන්, 2023 දෙසැම්බර් 31 දිනට තංගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අහිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන්, අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන්  අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා මුද්දර ගාස්තු ආදායම රු.70,483,141 ක් හා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.2,736,410 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයේ ආදායම් හා ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ජංගම නොවන වත්කම් හඳුනා ගැනීමේ ගිණුම් ප්‍රතිපත්තියෙන් බැහැරව මිලදී ගැණුම් පිරිවැය සඳහන් හා සඳහන් නොවූ මෝටර් රථ හා කරත්ත 32 ක එකතු වටිනාකම වූ රු.84,249,372 ක් තක්සේරු කර ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂය අවසානයේ මෝටර් රථ හා කරත්තවල වටිනාකම රු.17,330,628 ක් වැඩියෙන් දැක්වුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ජංගම නොවන වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සභා කාර්යාලය පිහිටි ඉඩමෙහි මායිම් තාප්පය ඉදිකිරීම වෙනුවෙන් ගෙවීම් කර තිබූ රු.1,615,062 ක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ද කර්මාන්ත 10 ක් සඳහා ගෙවිය යුතු එකතුව රු.1,560,222 ක් වූ 10% රැඳවුම් මුදල් කර්මාන්ත ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රාග්ධන වියදම් හා ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂයන්හීදී දරන ලද ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කළ නොහැකි එකතුව රු.1,068,585 ක් වූ අයභාර වියදම් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අයභාර වියදම් ප්‍රාග්ධනිත නොකළ යුතුය. |
| (ඉ) | 2019 වර්ෂයේදී සභා කාර්යාලයට තිර රෙදි මිලට ගැනීම් පිරිවැය රු.512,225 ක් ලී බඩු හා සවිකිරීම් යටතේ ද එකතු වටිනාකම රු.330,361 ක් වූ තොග අයිතම 37 ක් යන්ත්‍ර හා උපකරණ සහ ලීබඩු හා සවිකිරීම් යටතේ ද ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අයභාර වියදම් හා තොග අයිතම ප්‍රාග්ධනිත නොකළ යුතුය. |
| (ඊ) | බිල් නොකළ දැන්වීම් පුවරු 39 කින් ලැබිය යුතු රු.273,000 ක් හා දැන්වීම් පුවරු ලේඛනය තුළනයේදී මගහැරුණු රු.33,800 ක් ලෙස එකතුව රු.306,800 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | දැන්වීම් පුවරු 05ක් ඉවත් කර ඇති බවත්, ඉතිරි දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව සහ 2023 වර්ෂය සඳහා දැන්වීම් පුවරු සමීක්ෂණයේදී මෙම දැන්වීම් පුවරු නොතිබූ බව | සමීක්ෂණයන් නිවැරදිව සිදුකර ආදායම් බිල්කිරීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | 2019 වර්ෂයේදී වැයකර තිබූ රු.209,173 ක ප්‍රාග්ධන වියදම් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත නොකර ලී බඩු හා සවි කිරීම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඌ) | 2020 වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද පරිගණක දෙකක වටිනාකම යන්ත්‍ර හා උපකරණ යටතේ රු.204,570 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | බිල්කළ යුතු සහා බල ප්‍රදේශය තුළ පිහිටි ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්, ආපනශාලා සහ නවාතැන්පල ආදායමෙන් ලැබිය යුතු සියයට 01 ගාස්තුව රු.119,356 ක්, අඩුවෙන් .ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ආදායම් හා ඉදිරි ලැබීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම හේතුවෙන් එකතු වටිනාකම රු.117,531,023 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සතුටුදායක ලෙස පරික්ෂා කිරීමට නොහැකි විය. | 2016 වර්ෂයට පෙර සිට ගිණුම්වලට ගළපා තිබූ වටිනාකම් වලට අදාළ ලේඛන සොයා ගත නොහැකි බව සහ ස්ථාවර තැන්පතු සහතිකයක් නොමැති බව. | මූලා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය | 2018 වර්ෂයේදී හඳුනාගත් දියුණු කළ ප්‍රදේශ වලින් වරිපනම් බදු අයකිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | වරිපනම් සමීක්ෂණය සිදුකර දේපල තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | වසර 02 ඉක්ම වූ වටිනාකම රු.2,956,440 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂ 392 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | තැන්පත් ශේෂ ආදායමට ගැනීම සඳහා තැන්පත්කරුවන් දැනුවත් කිරීමේ ලිපි සකස් කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ 02 (ඇ) (viii) ඡේදය | මාණ්ඩලික නිලධාරීන් වෙත ලබාදෙනු ලබන ණය පහසුකම් අත්හිටුවීමට කටයුතු කළ යුතු වුවත්, එපරිදි කටයුතු නොකර සභාවේ ප්‍රජා සංවර්ධන නිලධාරී වෙත ආපදා ණය සහ උත්සව අත්තිකාරම් ලෙස රු.182,000 ක ණය පහසුකම් ලබා දී තිබුණි. | උත්සව අත්තිකාරම් අයකර ඇති බවත්, ආපදා ණය වාරික වශයෙන් අයකරන බව. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.144,176,712 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,507,935 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,478,000 | 8,343,339 | 7,783,087 | 1,389,327 | 775,000 | 1,139,984 | 1,343,406 | 829,075 |
| කුලී | 19,710,700 | 11,593,000 | 11,212,555 | 2,121,187 | 9,318,730 | 10,158,765 | 11,691,071 | 1,740,742 |
| බලපත්‍ර ගාස්තු | 1,776,100 | 8,685,034 | 7,454,016 | 1,761,543 | 6,735,000 | 3,871,426 | 3,925,401 | 530,525 |
| වෙනත් ආදායම් | 23,583,000 | 26,108,412 | 23,139,379 | 3,334,533 | 2,172,180 | 4,789,508 | 5,112,378 | 365,500 |
| **එකතුව** | **46,547,800** | **54,729,785** | **49,589,037** | **8,606,590** | **19,000,910** | **19,959,683** | **22,072,256** | **3,465,842** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපාර ඒකක 584 කින් ලැබිය යුතු ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු රු.1,166,900 ක් හා කඩ කාමර 73 කින් ලැබිය යුතු කුලී රු.859,147 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු රු.34,400 ක් හා කඩ කුලී රු.214,988 ක් අයකර ගත් බවත්, ව්‍යාපාර බදු රු.548,300 ක් හා හිඟ කඩ කුලී අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ) | ලැබිය යුතු අක්කර බදු රු.222,427 ක් හා වාර්ෂිකව බදුදෙන දේපළ 06 කින් ලැබිය යුතු කුලී රු.1,261,206 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩ කුලී රු.652,332 ක් අයකර ගෙන ඇති බව හා ඉකුත් වර්ෂ හිඟයන් අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | ව්‍යාපාර ඒකක 28 කින් ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු රු.1,414,726 ක් හා දැන්වීම් පුවරු 14 කින් ලැබිය යුතු ගාස්තු රු.342,900 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපාර 06 කින් රු.1,392,726 ක් අයකර ගෙන ඇති බවත්, 18 ක් සඳහා නඩු පවරා ඇති බව හා පවරු ගාස්තු රු.71600 ක් අය කර ගෙන ඇති බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.1,503,188 ක් හා රු.108,511,761 ක් විය. | උසාවි දඩ රු.1,433,724 ක් හා මුද්දර ගාස්තු රු.36,066,276 ක් අයකර ගෙන ඇති බවත්, ඉතිරිය අයකර ගැනීම සඳහා කටයුතු කරන බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු වාහන 03 ක් වෙනුවෙන් 2023 සැප්තැම්බර් මාසය සහ ඔක්තෝබර් මස 17 දින දක්වා වූ දෛනික ධාවන සටහන් පොත් අනුව ලබාගත් ඉන්ධන ලීටර් ප්‍රමාණය 490 ක් වුවත්, ඉන්ධන ලැබීම සහ නිකුත් කිරීම් ලේඛනයට අනුව ගබඩාවෙන් නිකුත් කළ ලීටර් ප්‍රමාණය 700 ක් වූයෙන් ලීටර් 210 ක වෙනසක් පැවති අතර එම ඉන්ධන තොගයේ වටිනාකම රු.72,710 ක් විය. | රු.72,210 ක මුදල සඳහා වගකිවයුතු සේවකයන් තිදෙනෙකුගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | ඉන්ධන තොගයේ වෙනස අයකර ගැනීමට සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ක්‍රියාමාර්ග ගත යුතුය |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව භුක්ති විදින ඉඩම් හා සුසාන භූමි 55 ක සහ වාහන 05 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් හා සුසාන භූමි පවරා ගැනීමට කටයුතු කරන අතර, වාහනවල ලියාපදිංචි අයිතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුය. |
| (ආ) | පිරිවැය සඳහන් නොවූ ගොඩනැගිලි 05 ක් තක්සේරුකරණය පිළිබඳව වෘත්තීය දැනුමක් නොමැති සභාවේ ආදායම් පරීක්ෂක හා ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් විසින් තාවකාලික තක්සේරුවක් සිදුකර එකතු වටිනාකම රු.45,600,000 ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම එම වටිනාකමින්ම වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් විධිමත් තක්සේරුවක් සිදුකර වටිනාකම් ගැළපීමට කටයුතු කරන බව. | පිරිවැය නිවැරදිව තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා සභා වාර්තාව අනුව 2022 වර්ෂයේ ඔක්තෝබර් මස අඩු ආදායම්ලාභී එක් දරුවෙකුට CR පොත් 10 ක් බැගින් වසම් 66 ක දරුවන්ට පොත් ලබාදීම සඳහා, පොත් 5,683 ක් වැඩිපුර මිලදීගැනීම වෙනුවෙන් රු.920,646 ක් වැයකර තිබුණි. | ඉදිරියේදී අවශ්‍යතාවය මත හා තීරණය කළ පරිදි පමණක් පොත් මිලදී ගැනීමට කටයුතු කරන බව. | අවශ්‍යතාවය මත මිලදී ගැනීම් කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 වගන්තියේ විධිවිධාන වලින් බැහැරව සිසු නිපුණතා වැඩසටහන සඳහා ත්‍යාග ලබාදීම හදිසි ප්‍රසම්පාදනයක් ලෙස රු.140,270 ක් වැයකර පිටු 120 CR පොත් 830 ක් සභා අරමුදලින් මිලදීගෙන තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළ බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ක්‍රීට් කැටගල් අතුරා සංවර්ධනය කරන ලද මාර්ග 15 ක් සඳහා ගෙවීම් කිරීමේදී ටොන් 1 – 2 ප්‍රමාණයේ රෝලක් මාර්ග සංවර්ධනය සඳහා භාවිතා කර නොතිබියදී ඒ සඳහා රු.226,298 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මාර්ග සංවර්ධනය සඳහා ටොන් 1-2 ප්‍රමාණයේ රෝලක් භාවිතා කළ බව. | වැඩිපුර ගෙවා ඇති වටිනාකම අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොන්ක්‍රීට් කැටගල් අතුරා සංවර්ධනය කර තිබූ ග්‍රාමීය මාර්ග 15 ක් සඳහා මුදල් රෙගුලාසි 156 (7) ප්‍රකාරව රජයට වාසිදායක අඩු මිලක් සහිත Grade 25 ප්‍රමාණයේ කැටගල් ඇතිරීමට කටයුතු නොකර වැඩි මිලක් සහිත Grade – 30 ප්‍රමාණයේ කැටගල් ඇතිරීම සඳහා ඇස්තමේන්තු කර ගෙවීම් කර තිබීම නිසා රු.377,560 ක පාඩුවක් සභා අරමුදලට සිදුව තිබුණි | දිගුකාලීන පැවැත්ම වෙනුවෙන් Grade 30 ගල් ඇතිරීම සිදුකළ බව. | රජයේ නිලධාරීන් රජයට වාසිදායක ලෙස කටයුතු කළ යුතු අතර එසේ කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | කොන්ක්‍රීට් කැටගල් අතුරා සංවර්ධනය කර තිබූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 15 ක් සඳහා මාර්ගවල දෙපස ඉදිකර තිබූ බැමි (Curb) සඳහා කම්බි යෙදීම වෙනුවෙන් ගෙවීම් කිරීමේදී මාර්ග මිල ගණන් ලේඛනයේ BO – 411 යටතේ ඇති මිලගණන් යොදා නොගෙන ST – 055 යටතේ ඇති මිල ගණන් යොදාගෙන ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කිරීම නිසා රු.88,656 ක් වැඩිපුර ගෙවා තිබුණි. | කොන්ක්‍රීට් බැමි ඉදිකිරීම සඳහා කම්බි යෙදීමේදී කම්බි බැඳීම, කැපීම යන කාර්යයන් සිදු කරන බැවින් ST - 055 රේටය යොදාගත් බව. | වැඩිපුර ගෙවා ඇති වටිනාකම අයකර ගත යුතුය. |
| (ඈ) | කර්මාන්ත දෙකක කානු පද්ධති ඉදිකිරීම සඳහා හැඩයම් වැඩ යොදා ගැනීමේදී යොදාගත යුතු මාර්ග මිල ගණන් ලේඛනයේ සඳහන් ST – 112 යටතේ ඇති මිලගණන් යොදා නොගෙන ST – 057 යටතේ ඇති මිලගණන් යොදාගෙන ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කිරීම නිසා රු.228,703 ක් වැඩිපුර ගෙවා තිබුණි. | කොන්ක්‍රීට් කානුවේ නිමාව සුමටව ලබා ගැනීම හා ශක්තිමත් බව ආරක්ෂා කර ගැනීම සඳහා ST – 057 රේටය යොදාගත් බව. | වැඩිපුර ගෙවා ඇති වටිනාකම අයකර ගත යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිවෙලින් 87 ක් හා 123 ක් වූයෙන් අතිරික්තතා 42 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි | අතිරික්ත සේවකයන් 42 ක් විධිමත් කර ගැනීමට කටයුතු කරන බව | කාර්ය මණ්ඩලයේ අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවේ සේවකයන් 06 දෙනෙකු වෙත තනතුරට හිමි අනුමත රාජකාරියෙන් බැහැරව වෙනත් රාජකාරි පවරා තිබූ අතර ඒ වෙනුවෙන් රු.3,059,250 ක වැටුප් හා දීමනා සභා අරමුදලින් ගෙවා තිබුණි. | සේවා අවශ්‍යතාවය මත වෙනත් රාජකාරී පවරා ඇති බවත් සේවකයින්ට නිත්‍ය තනතුරට අදාළ වැටුප් ගෙවන බව | සේවකයින් අනුමත රාජකාරිවල යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභා කාර්යමණ්ඩලය තුළ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 08 දෙනෙකුගේ අතිරික්තයක් සහ සේවකයන් 03 දෙනෙකු තනතුරට අදාළ නියමිත රාජකාරී පැවරීමකින් තොරව වෙනත් රාජකාරී පැවරීම සිදුකර තිබියදී, අනුමැතියකින් තොරව 2022 වර්ෂයේ දෙසැම්බර් මස දෛනික පදනම මත සේවකයින් තිදෙනෙකු බඳවාගෙන 2022 දෙසැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා රු.1,100,849 ක් වැටුප් හා දීමනා ලෙස සභා අරමුදලින් ගෙවා තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව බඳවා ගැනීම් සිදුකර ඇති බව. | අනුමැතියකින් තොරව බඳවා ගැනීම් නොකළ යුතුය. |
| (ඈ) | 2005 වර්ෂයේදී සේවය හැර ගොස් සිටි සේවකයකුගෙන් ලැබිය යුතු උත්සව අත්තිකාරම් රු.1,250 ක් හා ආපදා ණය රු.89,746 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට ලිපි ගොනු ඉදිරිපත් කර ඇති බව. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |